28

# පොළොන්නරු ථූපාරාමයේ බාහිර සැරසිලි මෝස්තර

*ඩී. එම්. පී. දිසානායක* [1]

*එච්. බී. යු. අයි. එච්. ගුණතිලක* [2]

HS/2013/0183, HS/2013/0266

පොළොන්නරු යුගයේ ප්‍රතිමා ගෘහයක් වන ථූපාරාමයේ බාහිර සැරසිලි මෝස්තර පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. ඒ අනුව, ථූපාරාම ප්‍රතිමා ගෘහය පිළිබඳ තොරතුරු විමර්ශනය කිරීමේදී අප විසින් ග්‍රන්ථ මූලාශ්‍ර සහ ක්ෂේත්‍ර ගවේෂණ උපයෝගි කර ගන්නා ලදි. එහිදී හමුවූ තොරතුරු සහ ඡායාරූප විශ්ලේෂණය කිරීම මගින් වැඩිදුර අධ්‍යයනයක් කිරීමට අපට හැකි විය. හින්දු ආගමික හා මහායාන ආගමේ බලපෑම මත මෙහි මූලික ආකෘතිය සකස් වී ඇත. එමෙන් ම මෙහි යොදා ඇති කැටයම් හා අනෙකුත් සැරසිලි මෝස්තර නිර්මාණයෙහි ලා හින්දු බලපෑම සෘජු ව ම ලැබී ඇති බව පෙනේ. මෙම සංකල්පය පොළොන්නරු යුගයේ ප්‍රතිමා ගෘහවල පොදු ලක්ෂණයක් සේ පෙනේ. ඒ අනුව ප්‍රතිමා ගෘහයේ පිටත බිත්තිවල දේව රූප, බ්‍රහ්ම රූප, වාමන රූප, මනුෂ්‍ය හා සත්ත්ව රූප, බොරදම් තීරු, ලීස්තර, පට්ටිකා, ස්ථම්භ හා විමාන උන්නත කැටයම් ආකාරයෙන් නිර්මාණය කර ඇත. ගඩොල් මාධ්‍යයෙන් කළ බිත්ති මත මූර්ති බදාමයෙන් මේවා නිමකර තිබේ. මේ ආකාරයට නිර්මාණය කර ඇති සැරසිලි මෝස්තර හේතුවෙන් බෞද්ධාගමික සිද්ධස්ථානයක් වන ථූපාරාම ප්‍රතිමා ගෘහය හින්දු දේවස්ථානයක ස්වරූපයක ගෙන ඇත. උතුරු ඉන්දියානු මෞර්ය ගෘහ නිර්මාණ සම්ප්‍රදාය අනුව යමින් මෙහි පිටත බිත්තිවල සැරසිලි මෝස්තර නිර්මාණය කර ඇත. අනුරාධපුර යුගයේ තිබූ ථේරවාදි බුදුදහමට අනුව නිර්මිත බෞද්ධාගමික සිද්ධස්ථානවල දක්නට නොලැබුණු පොළොන්නරු යුගයේදී දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ප්‍රතිමා සඳහා ගෘහයන් නිර්මාණය කිරීමත්, ඒවායේ ආකෘතිය හින්දු හා මහායාන බලපෑමට අනුව සකස් වීමත් ය. ඒ අනුව පිටත බිත්තිවල නිර්මාණය කර ඇති සැරසිලි මෝස්තරත්, පාදමෙහි යොදන ලද කැටයම් මෝස්තරත් සාම්ප්‍රදායික සිංහල ගෘහ නිර්මාණ ශෛලියට බෙහෙවින් ආගන්තුක ය. ඒ අනුව මෙම බෞද්ධාගමික ප්‍රතිමා ගෘහවලට හින්දු ආගමික බලපෑම ලැබීම පිළිබඳ ව අපට එළඹිය හැකි උපකල්පන දෙකකි. එක්කෝ, හින්දු ආගමට රාජ්‍ය අනුග්‍රහය ලැබීම නිසා සිදුවූ රාජ්‍ය බලපෑම මත වියහැකි ය. එසේ නැත්නම්, ඉන්දීය ද්‍රවිඩයන් සහ ශ්‍රී ලාංකිකයන් දශක ගණනාවක් තිස්සේ එක් ව විසීම නිසා මිශ්‍ර වූ සංස්කෘතියක ප්‍රතිඵලයක් නිසා විය හැකි ය.

ප්‍රමුඛ පදඃ පොළොන්නරු යුගය, ථූපාරාමය, ප්‍රතිමාගෘහ, සැරසිලි, හින්දු බලපෑම

*1 දෘශ්‍ය කලා හා සැලසුම්කරණය (විශේෂවේදී) පළමු වසර* miyurumc@gmail.com

*2 දෘශ්‍ය කලා හා සැලසුම්කරණය (විශේෂවේදී) පළමු වසර* umekaimali127@gmail.com